# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2428/11 - 2025 මාර්තු මස 19 වැනි බදාදා - 2025.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 වූ අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සළකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**අනුර කරුණාතිලක** (පා.ම.),
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය.

2025 මාර්තු මස 14 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
''සෙත්සිරිපාය'' අදියර - II,
බත්තරමුල්ල.

*කෑගල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශයේ සීමා මායිම් පුළුල් කිරීම*

**II උප ලේඛනය**

*I වැනි තීරුව*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල මහ නගර සභා බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 51ඒ රංවල ග්‍රාම නිලධාරී වසම, අංක 51බී කෑගල්ල නගරය. අංක 51ඊ ගොලහැල ග්‍රාම නිලධාරී වසම, අංක 51ජී මීපිටිය ග්‍රාම නිලධාරී වසම ද කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 12 කලුගල්ල ග්‍රාම නිලධාරී වසම. අංක 12ඒ දියගම ග්‍රාම නිලධාරී වසම, අංක 14 කරඩුපන ග්‍රාම නිලධාරී වසම, අංක 14ඒ පුවක්දෙනිය ග්‍රාම නිලධාරී වසම, අංක 14බී දිඹුල්ගමුව ග්‍රාම නිලධාරී වසම. අංක 14ඩී කොලොන්ගොල්ල ග්‍රාම නිලධාරී වසම, අංක 52 අඹන්පිටිය ග්‍රාම නිලධාරී වසම, අංක 52ඒ බෙරගල ග්‍රාම නිලධාරී වසම, අංක 52බී ඌරාඋල්ල ග්‍රාම නිලධාරී වසම, අංක 52සී පරණගම්පල ග්‍රාම නිලධාරී වසම, අංක 53සී වල්දෙනිය ග්‍රාම නිලධාරී වසම, අංක 53 ඩී දික්ඇල්ල ග්‍රාම නිලධාරී වසම, අංක 53ඊ පරගම්මන ග්‍රාම නිලධාරී වසම, අංක 14ඊ පල්ලේවෙල ග්‍රාම නිලධාරී වසම, අංක 50ඒ නිල්මල්ගොඩ ග්‍රාම නිලධාරී වසම, අංක 51සී ඔලගන්කන්ද ග්‍රාම නිලධාරී වසම, අංක 51ඩී වැවලදෙනිය ග්‍රාම නිලධාරී වසම ද ඇතුළත්ව මෙහි දෙවන තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය ලෙසට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

*II වැනි තීරුව*

*උතුරට :*

කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අංක 52සී පරණගම්පල ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම අංක 52බී ඌරාඋල්ල ග්‍රාම නිලධාරී වසමේ බටහිර හා උතුරු මායිම සමග එකිනෙකට හමුවන ලක්ෂ්‍යය ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගෙන (1) එතැන් සිට එකී පරණගම්පල ග්‍රාම නිලධාරී වසමේ බටහිර හා උතුරු මායිම් ඔස්සේ උතුර, ඊසාන හා නැගෙනහිර දිශානුගතව කෑගල්ල මහා නගර සභා බල ප්‍රදේශයට අයත් අංක 51ඒ රංවල ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය (2) තෙක් අඳින ලද රේඛාව, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ ගිනිකොණ හා ඊසාන දිශානුගතව ඇඳි රේඛාව තවදුරටත් කෑගල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් අංක 51ඩී වැවලදෙණිය ග්‍රාම නිලධාරී වසමේ දකුණු හා බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය තෙක් ද (3) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ බටහිර හා උතුරු මායිම් ඔස්සේ උතුර, ගිනිකොණ, දකුණ හා ඊසාන දිශානුගතව අංක 51සී ඔලගන්කන්ද ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (4) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ බටහිර හා උතුරු මායිම් ඔස්සේ උතුර, ඊසාන, නිරිත හා ගිනිකොණ දිශානුගතව කෑගල්ල මහ නගර සභා බල ප්‍රදේශයේ අංක 51ජී මීපිටිය ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (5) එතැන් සිට එකී වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන දිශානුගතව කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 14ඒ පුවක්දෙණිය ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (6) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඔස්සේ ඊසාන දිශානුගතව ඇඳි රේඛාව තවදුරටත් අංක 14බී දිඹුල්ගමුව ග්‍රාම නිලධාරී වසමෙහි බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද (7) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව එකී ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (8) එතැන් සිට එකී උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව අංක 14ඩී කොලොන්ගොල්ල ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (9) එතැන් සිට එකී කොලොන්ගොල්ල ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන හා ගිනිකොණ දිශානුගතව අංක 12ඒ දියගම ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (10) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ බටහිර හා උතුරු මායිම් ඔස්සේ එකී ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද (11)

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට එකී ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොණ දිශානුගතව අංක 12 කළුගල්ල ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (12) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර හා දකුණු මායිම් ඔස්සේ නිරිත, ගිනිකොණ, දකුණ,

උපලේඛනය II *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|

වයඹ හා නැවන නිරිත දිශානුගතව ඇඳි රේඛාව තවදුරටත් අංක 14 ඩී කොලොන්ගොල්ල ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර සීමා මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (13) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දිශානුගතව ඇඳි රේඛාව, තවදුරටත් අංක 14ඒ පුවක්දෙණිය ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (14) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොණ හා බටහිර දිශානුගතව අංක 14 කරඳුපන ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද (15) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොණ දිශානුගතව එකී ග්‍රාම නිලධාරී වසමේ දකුණු සීමා මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (16)

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට එකී අංක 14 කරඳුපන ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම ඔස්සේ බටහිර දිශානුගතව අංක 14ඊ පල්ලෙවෙල ග්‍රාම නිලධාරී වසමේ දකුණු හා නැගෙනහිර සීමා මායිම් හමුවන ලක්ෂ්‍යය තෙක් ද (17) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම ඔස්සේ නිරිත හා වයඹ දිශානුගතව අංක 50ඒ නිල්මල්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර සීමා මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (18) එතැන් සිට එකී නිල්මල්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර හා දකුණු මායිම් ඔස්සේ දකුණ, නිරිත හා වයඹ දිශානුගතව ඇඳි රේඛාව තවදුරටත් අංක 53ඊ පරගම්මන ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර සීමා මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (19) එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර හා දකුණු මායිම් ඔස්සේ නිරිත හා බටහිර දිශානුගතව අංක 53ඩී දික්ඇල්ල ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද (20) එතැන් සිට එකී දික්ඇල්ල ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර හා දකුණු මායිම් ඔස්සේ දකුණු හා වයඹ දිශානුගතව අංක 52බී ඌරාඋල්ල ග්‍රාම නිලධාරී වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද (21) එතැන් සිට එකී වසමේ දකුණු මායිම ඔස්සේ බටහිර දිශානුගතව එම ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, (22)

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 52 බී ඌරාඋල්ල ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම තෙක් ඇඳි රේඛාව තවදුරටත් එම වසමේ බටහිර මායිම ඔස්සේම උතුරු දිශානුගතව කෑගල්ල මහ නගර සභා සීමාව පසු කරමින් ආරම්භක ලක්ෂ්‍යය තෙක් අඳින ලද රේඛාව ඇතුළත පිහිටියා වූ ප්‍රදේශය.

EOG 03 - 0173

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.